පලාත් අධ්‍යාපන දෙපාර්තමෙන්තුව - සබරගමුව

| | | |
|---|---|---|
| විෂය - චිත්‍ර විෂය | සතිය -<br>ශ්‍රේණිය - 6 | සැකසුම - උපුලී චතුරානි ධර්මසේන<br>මාවනැල්ල අධ්‍යාපන කලාපය |

# 6.1.3 දානය දයාව පිරි රාමසන් උත්සවය





යාඥා කිරීම



රාමසාන් උත්සව දින විචිත්‍ර අංග

- රාමසන් උත්සවය (ඊදුල් ෆිත්ර්) ඉස්ලාම් ජනතාවට සුවිශේෂී උත්සවයකි.
- ඉස්ලාම් දින දර්ශනයට අනුව නව වන මාසයේ එනම්, රාමාලාල් මාසයේ නව සඳ දුටු තැන සිට දස් වන මාසයේ එනම්, ෂව්වාල් මාසයේ නව සඳ දක්වා උපවාස කාලෙකින් පසු රාමසන් උත්සවය සමරයි.

**<u>උපවාස කාලය (සව්ම් සමාදන් වීම)</u>**

- මෙම කාලයේදී මුස්ලිම් බැතිමතුන් ඉතා අධික භක්තියෙන් යුතුව උපවසයේ නියලෙති.
- මෙම උපවාස කාලය සව්ම් යන අරාබි වහරෙන් හඳුන්වනු ලැබේ.
- උපවස කාලයේදී අලුයම නැමදුම් වේලාව ආර්ම්භ වීමට මොහොතකට පෙර සිට හිරු බැස යන කාලයවන තුරු කිසිදු ආහාරපාන ගැනීමක් හෝ පවාසය කඩවන දෙයක් සිදු නොකරයි.
- වයස අවුරුදු 10 ට වැඩි සියලු මුස්ලිම් පිරිමි හා ස්ත්‍රීන්ට උපවාසය රැකීම අනිවාර්ය වේ. කුඩා දරුවන්, රෝගීන්, වයෝවෘධයන් ගැබිනි මව්වරුන් හා කිරි දෙන මව්වරුන් සඳහා සහන විකල්ප ඇත.

**උත්සව සමයේ දැක ගත හැකි යහපත් ක්‍රියාකාරකම්**

- සවුම් සමාදන් වීම මඟින් කුසගින්නේ කුරුරු බව අවබෝධ වීමා නිසා දිළින්දන්ට පිහිට වීමේ ආකල්පය ඇති වීම්.
- එහෙයින් මෙම කාලයේ බහුල වශයෙන් සකාත් යන අනිවාර්ය දානයද සදකා යන අනිවාර්ය නොවන දානයද ඩෙනු ලැබේ.
- උපවාසයේ යෙදීමේදී සිත දමනය කර ජීවත් වීමට පුහුණුවක්ද ඉවසීමෙන් ජීවත් වීමේ හැකියාවද හා යහපත් විනයක් පවත්වා ගැනීමට පුහුණුවක්ද ලැබේ.
- මෙම කාලයේ මොවුන් වැඩි වශයෙන් යාඥා කරමින් හා ශුද්ධ වූ කුරාණය පරායනයේ (කියවමින්) පසුවෙති. අල්ලා දෙවියන්ගෙන් මේ සඳහා ඉතා ආනිශංස ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.

**රාමසාන් උත්සවය පැවැත්වීම**

- නව සඳ දැකීමෙන් පසු උපවාස කාල්‍ය අවසන් වේ.
- උපවාස කාලය අවසන් වීමත් සමඟ මස්ජිදයට ගොස් යාඥා කර රාමසාන් උත්සවය පැවැත්වීම ප්‍රධාන කාර්යය වේ.මෙය පසුදා උදේ නැමදුම අවසන් වීමට පෙර කළ යුතුය.
- රාමසන් දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියවකි ""සකාතුල් ෆිත්රා" නම් දානය දීම.
(පවුලේ සංඛ්‍යාව අනුව එක් අයෙකුට 2kg ක් බැගින් පස් දෙනෙක් සිටීනම් 10kg ක් දන් දිය යුතුය.

ඇගයීම

1. රාමසන් උත්සවය සමරන්නේ කුමන ආගමිකයින් ද?

   ......................................

2. සව්ම් සමදන් වීම යනු කුමක් ද?

   ....................................................................................................................................

3. මේ කාලයේදී මුස්ලිම්වරුන් විසින් දෙනු ලබන දාන මොනවා ද?

   ....................................................................................................................................

4. ඊදුල් ෆිත්ර් ලෙස හඳුන්වන්නේ කුමක්ද?
   ....................................................................................................................................

5. උපවාස කාලයේදී ඉස්ලාම් බැතිමතුන්තුල වරධනය වන ආකල්ප හා ගුණධර්ම මොනවද?
   ....................................................................................................................................
   ....................................................................................................................................